# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා දුම්රිය හරස් මාර්ග නිරීක්ෂණ පද්ධතියක් (Level Crossing Monitoring System) ප්‍රසම්පාදනය කිරීම

### IFB අංකය : SRS F. 8169

1. කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපතිවරයා විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා දුම්රිය හරස් මාර්ග නිරීක්ෂණ පද්ධතියක් සැපයීම වෙනුවෙන් දේශීය නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු භාර ගනු ලැබේ.
2. ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාපටිපාටිය හරහා සිදු කරනු ඇත.
3. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ ලංසු ලිපිලේඛන පරීක්ෂා කොට බැලීම, පහත සඳහන් ලිපිනයෙන් 2026/05/19 සිට 2026/06/15 දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සිදුකළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**දුරකථන අංක :** 94 (11) 2438078 හෝ 94(11) 4600202
**ෆැක්ස් අංකය :** 94(11) 2432044
**ඊමේල් :** srs.slr@gmail.com, tender1@railway.gov.lk
**වෙබ් අඩවිය :** www.railway.gov.lk

4. ලංසුකරුට ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයට පෙර අවම වශයෙන් පසුගිය වසර 3 ක කාලය සඳහා කොන්ත්‍රාත්කරු, අනුකොන්ත්‍රාත්කරු හෝ කළමනාකරණ කොන්ත්‍රාත්කරු යන භූමිකාවන්හි කොන්ත්‍රාත් පළපුරුද්ද තිබිය යුතුය. පසුගිය වසර 5 ඇතුළත සාර්ථකව සහ සැලකිය යුතු ලෙස නිම කරන ලද, එක් එක් කොන්ත්‍රාත්තුවක වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 100 ක් වූ සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තු අවම වශයෙන් 2 කට කොන්ත්‍රාත්කරුවෙකු, කළමනාකරණ කොන්ත්‍රාත්කරුවෙකු හෝ අනුකොන්ත්‍රාත්කරුවෙකු ලෙස දායක වී තිබිය යුතුය.
5. උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව (ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව) ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසුව, 2026/05/19 සිට 2026/06/15 දක්වා ප.ව. 3.00 දක්වා රුපියල් 20,000/- ක ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.
6. පූර්ව ලංසු රැස්වීම 2026/06/02 දින පෙ.ව. 10.00 ට දෙමටගොඩ, සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ අනුශාඛාවේදී පැවැත්වේ.
7. සියලුම ලංසු සමඟ ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකර මුදල රුපියල් 1,000,000.00 ක් විය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඇපකරයක් (unconditional guarantee) විය යුතුය.
8. ලංසු 2026/06/16 දින ප.ව. 2.00 හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී වීමට අවස්ථාව ඇත. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර ගනු නොලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන අනුශාඛා කාර්යාලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය :** SRS/F.8169

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය**